# 4 ශ්‍රේණිය සිංහල 2022

# ගුරු අත් පොතට වැඩ පොත අංක 09

## L6, S6, R6 W6 නිපුණතා ආවරණය



- යමෙකු විසින් කරන කතාවකට ඉවසීමෙන් යුතු ව සවන් දී සාකච්ඡාවේ යෙදෙයි.
- සුබ පැතුම් පත් නිර්මාණශීලී ව සකස් කර ඉදිරිපත් කරයි.
- යම් අදහසක් කාටූන් මඟින් ඉදිරිපත් කරයි.
- දෙන ලද කරුණුවල සුවිශේෂතා කෙරෙහි අවබෝධයෙන් යුතු ව වගුගත කරයි.
- පෞද්ගලික ලිපියක් ලිවීමේ අරමුණු නිවැරදි ව පවසයි.
- පෞද්ගලික ලිපියක අඩංගු විය යුතු සුවිශේෂ කරුණු ප්‍රකාශ කරයි.
- පෞද්ගලික ලිපියක් ලිවීමේ හුරුව ලබයි.


සැකසුම - හසිත හෙට්ටිආරච්චි

(Dip. In Sci. N.I.E./O.U.S.L.)



Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 4 ශ්‍රේණිය මව්බස (සිංහල)

# $L_6$ $S_6$ $R_6$ $W_6$ ඉගෙනුම් පල

- යමෙකු යමෙකු විසින් කරන කතාවකට ඉවසීමෙන් යුතු ව සවන් දී සාකච්ඡාවේ යෙදෙයි.
- සුබ පැතුම් පත් නිර්මාණශීලී ව සකස් කර ඉදිරිපත් කරයි.
- යම් අදහසක් කාටූන් මඟින් ඉදිරිපත් කරයි.
- දෙන ලද කරුණුවල සුවිශේෂතා කෙරෙහි අවබෝධයෙන් යුතු ව වගුගත කරයි.
- පෞද්ගලික ලිපියක් ලිවීමේ අරමුණු නිවැරදි ව පවසයි.
- පෞද්ගලික ලිපියක අඩංගු විය යුතු සුවිශේෂ කරුණු ප්‍රකාශ කරයි.
- පෞද්ගලික ලිපියක් ලිවීමේ හුරුව ලබයි.

## ගුරුවරුන් සමඟ සන්නිවේදනය

- ගුරුවරුන් සමඟ එකතු වී විවේකය ඵලදායී ව ගත කරන ආකාරය පිළිබඳ ව සාකච්ඡාවක් කරන්න. රසවත් කතන්දරයක් පවසන්න. ගුරුවරයා යම් ද්‍රව්‍යයක්/ සතෙකු/ එළවළු වර්ගයක්/ මලක් ආදි එක් දෙයක් පිළිබඳ ව සිතා ගත් විට සිතාගත් දෙය කුමක් දැයි ප්‍රශ්න අසා සොයා ගන්න. එහි දී ඔව්, නැත යනාදී පිළිතුරු ලබා දිය හැකි ප්‍රශ්න පමණක් අසන්න. උදා :

✓ ඒක පණ ඇති දෙයක් ද ?

✓ එය ආහාරයට ගන්නා දෙයක් ද ?


## විශේෂිත පුද්ගලයන් සමග සන්නිවේදනය

- විශේෂිත පුද්ගලයන් සමඟ සන්නිවේදනය සඳහා තෝරා ගත හැකි පුද්ගලයන්

1. තම පාසලේ මූලික අධ්‍යාපනය ලබා වර්තමානයේ උසස් රැකියාවක නිරත වන්නෙක්
2. ස්වෝත්සාහයෙන් ජයගත් පුද්ගලයෙක්
3. නිර්මාණශීලී නිපැයුම්වල යෙදී ප්‍රසිද්ධ වූ අයෙක්
4. ගැටලුවලට මුහුණ දී ජය ගත් අයෙක්
5. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

## සුබ පැතුම් පත්

- 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන අයියලාට/අක්කලාට/අයියලා අක්කලාට, විභාගයට සුබ පතා සුබ පැතුම් පතක් සකස් කරන්න.



1. සුබ පැතුම් පත කුමක් සඳහා ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. එය ලියා ඇත්තේ කවරෙක් ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. කවුරුන් සඳහා ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. සුබ පැතුම් පත් නිර්මාණය කළ හැකි වෙනත් අවස්ථා මොනවා ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

- සුබ පැතුම් පතක් ලිවීමේ දී අඩංගු විය යුතු කරුණු
    1. සුබ පැතුම් පත කුමක් සඳහා ද ? යන්න
    2. එය ලියා ඇත්තේ කවරෙක් ද ? යන්න
    3. කවුරුන් සඳහා ද ? යන්න
    4. සුබ පැතුමෙහි විස්තරය

## <u>වගුගත කිරීම්</u>

- දී ඇති වගු සම්පූර්ණ කර ද්‍රව්‍ය වර්ග කරන්න.

| එළවළු | පලතුරු |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

| කුරුල්ලන් | සිවුපා සතුන් |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

| ධාන්‍ය වර්ග | ඖෂධ |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

| මල් වර්ග | ගස් වර්ග |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

## පෞද්ගලික ලිපි

- පෞද්ගලික ලිපියක ආකෘතිය

  ✓ ලිපියේ දකුණු පසින් ලිපිය ලියන ස්ථානයත්, දිනයත් සඳහන් කරන්න.

  ✓ එහි දී ස්ථානය ලියූ තැන අගට කොමාව යොදන්න.

  ✓ පෞද්ගලික ලිපියක් ලිවීමේ දී ලිපිය යවන්නාට ආශිර්වාද කිරීමට සුදුසු ආශිර්වාද වදනක් ලියන්න. උදාහරණ - සැප වේවා!

  ✓ ආශීර්වාදය ලියා අවසානයේ දී හර්ෂාදි ලකුණ යොදන්න. ඥාතීන්ට ලිපියක් ලිවීමේ දී ආමන්ත්‍රණය සඳහා ආදරණීය/සඳාදරණීය/දයාබර වැනි වදන් යොදන්න.

  ✓ මිතුරෙකුට හෝ වෙනත් හිතවතෙකුට හෝ ලිවීමේ දී මා හිතවත් යනුවෙන් ලියා මිතුරාගේ /මිතුරියගේ නම සඳහන් කරන්න.ආමන්ත්‍රණය ලියා අවසානයේ කොමාව යොදන්න.

|  |
|---|
| ස්ථානය<br>දිනය |
| ආශීර්වාදය |
| ආමන්ත්‍රණය |
| කරුණු ලිවීම . . . . . . . . . . .<br>. . . . . . . . . . . . . . . . . . . . .<br>. . . . . . . . . . . . . . . . . . . . .<br>. . . . . . . . . . . . . . . . . . . . .<br>. . . . . . . . . . . . . . . . . . . . .<br>. . . . . . . . . . . . . . . . . . . . . |
| අවසානය |

  ✓ කරුණු ලිවීමේ අවස්ථාවේ දී ආමන්ත්‍රණයට යටින් ඇති රූලේ කුඩා ඉඩ ප්‍රමාණයක් හැර ලිවීම ආරම්භ කරන්න.

  ✓ එහි දී ඥාතියාගේ/ මිතුරාගේ/මිතුරියගේ/ සහෝදරයාගේ/සහෝදරියගේ සුවදුක් විමසීමත්, තමා ඇතුළු පවුලේ අය සුවෙන් සිටින බවත් ලියන්න.

  ✓ ලිවිය යුතු කරුණු ජේළි හයක්/අටක් වැනි ප්‍රමාණයකින් ලියන්න. කරුණු ලියා අවසානයේ දී ද සෙත් පැතීම සඳහා වාක්‍යයක් ලියන්න. සෙත් පැතීම තමාගේ ආගමට අනුව තෙරුවන් සරණ යි/ජේසු පිහිට යි/දෙවි රැකවරණ යි . . . ආදි ලෙසින් කළ හැකි ය.

  ✓ ලිපිය ලියා අවසන් කරන විට ලිපිය ලියූ තැනැත්තා කවරෙක් ද යන්නත් නමත් සඳහන් කරන්න. නමට ඉහළින් ඇති වචනයේ අගට කොමාව යොදන්න.

- දී ඇති ලිපිය කියවා බලා පහත සඳහන් එක් අවස්ථාවක් යටතේ පෞද්ගලික ලිපියක් ලියන්න.

  1. ඔබ පාසල් නේවාසිකාගාරයක නැවතී සිට පාසල් යන දුවෙක්/පුතෙක් ඔබ යැයි සිතා තම මවට/පියාට/ආච්චි අම්මාට/සීයාට තමාගේ විස්තර දන්වා යවන ලිපියක්

  2. ඔබගේ හොඳ ම මිතුරා/මිතුරිය අසනීප වී සිටින බව දැනගත් විට ඒ පිළිබඳ තොරතුරු විමසමින් යවන ලිපියක්

  3. ඔබත් පවුලේ අයත් ඉදිරියේ දී යාමට බලාපොරොත්තු වන විනෝද ගමනකට ඔබේ යහ'වෙක්/යෙහෙළියක සහභාගි කර ගැනීමට කැමැත්ත විමසමින් යවන ලිපියක්

නිවසේ දී,
2018.08.08

සෙත් වේවා !

මා හිතවත් පසිඳු වෙත,

ඔබගේ සැපදුක් කෙසේ ද? මම සුවෙන් සිටිනවා. ඔබගේ අම්මා, තාත්තා සහ අක්කා ද සුවෙන් ඇතැයි සිතනවා.


අගෝස්තු නිවාඩු කාලය ලැබුණු පසු, මම ඔබගේ නිවසට පැමිණෙන්නම්. එවිට අපට සෙල්ලම් කිරීමට හැකි වේවි. ඔබේ ගමේ ඇවිදීමට ද මම ආශාවෙන් සිටිනවා. මා පැමිණෙන දිනය ඔබට පසු ව දන්වා එවන්නම්.

ඔබගේ පවුලේ සැම මතක් කළ බව පවසන්න.
ඔබ සැමට තෙරුවන් සරණ යි !

හිතවත් මිතුරා,
දෙනුවන්

# <u>කාටූන්</u>

- පහත දැක්වෙන කාටූන්වලින් කියවෙන පණිවිඩය පිළිබඳ ව ඔබේ අදහස් ලියන්න.



. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

- පහත දී ඇති අවස්ථා වලින් ඔබ කැමති අවස්ථාවක් තෝරා ගෙන කාටූන් චිත්‍රයක් බැගින් අඳින්න. ප්‍රදර්ශනය කරන්න.

1. අවස්ථාව
   - ✓ ගගක ඉවුර අසල තාරා පැටවු දෙන්නෙකු සිටිනවා.
   - ✓ ඒ අසලට හාවෙකු ඇවිත් ගගෙන් එගොඩ කරවිය හැකි දැයි අසනවා.
   - ✓ තාරා පැටවුන් දෙන්නාගේ පිට උඩ නැග හාවා ගගෙන් එතෙර වෙනවා.

2. අවස්ථාව
   - ✓ ගංගාවක පතුලේ ගෙඹි පැටවුන් දෙදෙනෙකු කණු දෙකක ලණුවක් බඳිනවා. (ලණුව බැඳ ඇත්තේ කොකෙකුගේ කකුල් දෙකක යි.)
   - ✓ ඒ බව නොදත් ගෙඹි පැටවු දෙන්නා බැඳපු ලණුවේ නැග සිටිනවා.
   - ✓ කොකා ගෙඹි පැටවුන් දෙන්නා රැගෙන ඉහළ අහසට ඉගිලී යනවා. ගෙඹි පැටවුන් බයෙන් සිටිනවා.

# පුනරීක්ෂණ

**(1) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ඈත අතීතයේ කාලෙක යොසාකු කියලා තරුණ ගොවියෙක් හිටියා. එක දවසක් කුඹුරේ වැඩ කරමින් සිටිය දී සර්පයෙක් මකුළුවෙකු අල්ලා ගන්න හදන හැටි යොසාකු දැක්කා. යොසාකුට මකුළුවා ගැන හරියට දුක හිතුණා. ඔහු උදැල්ල අරන් එතැනට දුවලා සර්පයා බය කර පැන්නුවා.

1. තරුණ ගොවියාගේ නම කුමක්ද? ..................................................

2. මකුළුවෙකු අල්ලා ගැනීමට උත්සාහ කළේ කවුද? ..................................

3. විරුද්ධාර්ථ පදය ලියන්න.

   නොදැක්කා - ..............

4. 'උදුැල්ල' ඉරී ඇඳි අකුරේ ඇති පිල්ලමේ නම කුමක්ද? ...........................

5. 'ඔහු සර්පයා බය කර පැන්නුවා' මෙම වාක්‍ය ලිඛිත බසට හරවා ලියන්න.

   ..........................................................................................

**(2) වර්තමාන කාල ක්‍රියා පදය යොදා හිස්තැන් පුරවන්න.**

1. මම පාසලට ..........................................................................
2. අපි තියර දිගේ ......................................................................
3. නංගී පාඩම් ........................................................................
4. ගඟ මුහුදට ගලා ....................................................................
5. කුරුල්ලා අහසේ පියාසර ..........................................................

**(3) පහත කවි සම්පූර්ණ කරන්න.**

1. වනන්තරේ ඈත එපිට

   ..........................................................................................

   නිල් වතුරෙන් පිරුණු කලට

   ..........................................................................................

2. ගැඹුරු විලේ මඩ වගුරේ

   ..........................................................................................

   ගොඩ එන්නට බැරිව දුකින්

   ..........................................................................................

**(4) එක් එක් වචනවල ඇති පිල්ලම් සියල්ලම නම් කරන්න.**

1. ඖෂධීය - ..........................................................................
2. වාක්‍ය - ..........................................................................
3. වෘත්තය - ..........................................................................
4. හිරු - ..........................................................................
5. මැරෑහ - ..........................................................................

**(5) ගැළපෙන අකුරු කොටුව තුළින් තෝරා ලියන්න.**

| ධ , ළු , එ , භ , ප , ශ , න , ණ , ක , රෑ , රු , ස |
|---|

1. විභාග ප්‍රති.........ල
2. හිරු .........ස්
3. පු.........ද්ද
4. පරීක්ෂ...........



(6) නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. අම්මා එනතුරු (මම / අපි) බලා සිටියෙමි.
2. අපි තෙල් මල් රැගෙන පන්සල් (ගියෝය / ගියෙමු)
3. (ළමුන් / ළමයි) සෙල්ලම් කිරීමට පිටියට ගියහ.
4. කිකිළිය පසුපස පැටව් දුවගෙන (යයි / යති)
5. මල්ලීට අලුත් ඇඳුමක් මැසීමට අම්මා (සිතුවාය / සිතුවේය)

(7) නිවැරදි ස්ත්‍රීලිංග පදය ලියන්න.

1. මුවා - .............
2. මුවෝ - .............
3. ඇත්තු - .............
4. හිවලා - .............
5. වෘකයා - .............

(8) කොටුව තුළ ඇති වචන පමණක් උපයෝගී කරගෙන නිවැරදි වාක්‍ය 5ක් ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| දෙමාපියෝ | ගස් | සෙනසුරාදා | බැලීමට | විත්‍ර |
| යට | ගියාය | සිසුහු | ගියෙමු | නරඹා |
| ගුරුතුමිය | ගොස් | අද්දර | ළමයින් | වැව |
| නැරඹූහ | අපි | සීගිරිය | ඉඳගත්හ | සෙවණේ |

1. ..............................................................................................
2. ..............................................................................................
3. ..............................................................................................
4. ..............................................................................................
5. ..............................................................................................

(9) පහත අනුක්ත පද උක්ත පද කර ලියන්න.

1. පැටවුන් - ............................ 2. ළමයින් - ..........................
3. මොනරුන් - ............................ 4. අප - ..........................

(10) දී ඇති වචන ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

අසල්වැසියෝ, අම්මා, මල්, පලතුරු, පොල් මුල, වත්ත, බිරිඳ, ලොකු අම්මා, සිඟිත්තිය, කොහු, පූසි පැටවා, සීයා, සායම්, පැදුරු, අකුර, ලේඛිකාව, චිත්‍රය, නැන්දා, සම්මාන, තාත්තා

| ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

# පිළිතුරු



Answer

# 4 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $L_6$ $S_6$ $R_6$ $W_6$ ඉගෙනුම් පල

- යමෙකු යමෙකු විසින් කරන කතාවකට ඉවසීමෙන් යුතු ව සවන් දී සාකච්ඡාවේ යෙදෙයි.
- සුබ පැතුම් පත් නිර්මාණශීලී ව සකස් කර ඉදිරිපත් කරයි.
- යම් අදහසක් කාටූන් මඟින් ඉදිරිපත් කරයි.
- දෙන ලද කරුණුවල සුවිශේෂතා කෙරෙහි අවබෝධයෙන් යුතු ව වගුගත කරයි.
- පෞද්ගලික ලිපියක් ලිවීමේ අරමුණු නිවැරදි ව පවසයි.
- පෞද්ගලික ලිපියක අඩංගු විය යුතු සුවිශේෂ කරුණු ප්‍රකාශ කරයි.
- පෞද්ගලික ලිපියක් ලිවීමේ හුරුව ලබයි.

## ගුරුවරුන් සමඟ සන්නිවේදනය

- ගුරුවරුන් සමඟ එකතු වී විවේකය ඵලදායී ව ගත කරන ආකාරය පිළිබඳ ව සාකච්ඡාවක් කරන්න. රසවත් කතන්දරයක් පවසන්න. ගුරුවරයා යම් ද්‍රව්‍යයක්/ සතෙකු/ ඵළවළු වර්ගයක්/ මලක් ආදි එක් දෙයක් පිළිබඳ ව සිතා ගත් විට සිතාගත් දෙය කුමක් දැයි ප්‍රශ්න අසා සොයා ගන්න. එහි දී ඔව්, නැත යනාදී පිළිතුරු ලබා දිය හැකි ප්‍රශ්න පමණක් අසන්න. උදා :

✓ ඒක පණ ඇති දෙයක් ද ?
✓ එය ආහාරයට ගන්නා දෙයක් ද ?


## විශේෂිත පුද්ගලයන් සමඟ සන්නිවේදනය

- විශේෂිත පුද්ගලයන් සමඟ සන්නිවේදනය සඳහා තෝරා ගත හැකි පුද්ගලයන්

1. තම පාසලේ මූලික අධ්‍යාපනය ලබා වර්තමානයේ උසස් රැකියාවක නිරත වන්නෙක්
2. ස්වෝත්සාහයෙන් ජයගත් පුද්ගලයෙක්
3. නිර්මාණශීලී නිපැයුම්වල යෙදී ප්‍රසිද්ධ වූ අයෙක්
4. ගැටලුවලට මුහුණ දී ජය ගත් අයෙක්
5. **දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙක්/ ගායකයෙක්/ වාදකයෙක්**. . . . . . . . . . . .

## සුබ පැතුම් පත්

- 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන අයියලාට/අක්කලාට/අයියලා අක්කලාට, විභාගයට සුබ පතා සුබ පැතුම් පතක් සකස් කරන්න.




. . . . . . . . . වර්ෂයේ
විභාගයට පෙනී සිටින
පස් වන ශ්‍රේණියේ
අයියලාට/අක්කලාට/
අයියලා අක්කලාට
විශිෂ්ට ජයක් ලබන්නට
අපි ප්‍රාර්ථනා කරමු.

හතර වන ශ්‍රේණියේ
නංගිලා/මල්ලිලා

1. සුබ පැතුම් පත කුමක් සඳහා ද ?

විභාගයට පෙනී සිටින අයියලාට/අක්කලාට සුබ පැතීමට . . . . . . .

2. එය ලියා ඇත්තේ කවරෙක් ද ?

හතර වන ශ්‍රේණියේ නංගිලා/මල්ලිලා . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. කවුරුන් සඳහා ද ?

විභාගයට පෙනී සිටින පස් වන ශ්‍රේණියේ අයියලාට/අක්කලාට . .

4. සුබ පැතුම් පත් නිර්මාණය කළ හැකි වෙනත් අවස්ථා මොනවා ද ?

උපන් දිනය, විවාහය, විවාහ සංවත්සර, නව වසරට ආසිරි පැතීම, නත්තල, වෙසක් ආදි විශේෂ උත්සව සැමරීමට විභාග, තරග ආදියෙන් ලත් ජයග්‍රහණ සහ තනතුරු උසස් වීම් වැනි අවස්ථාවල

- සුබ පැතුම් පතක් ලිවීමේ දී අඩංගු විය යුතු කරුණු
    1. සුබ පැතුම් පත කුමක් සඳහා ද ? යන්න
    2. එය ලියා ඇත්තේ කවරෙක් ද ? යන්න
    3. කවුරුන් සඳහා ද ? යන්න
    4. සුබ පැතුමෙහි විස්තරය

## වගුගත කිරීම්

- දී ඇති වගු සම්පූර්ණ කර ද්‍රව්‍ය වර්ග කරන්න.

| එළවළු | පලතුරු |
|---|---|
| කැරට් | අඹ |
| ගෝවා | දොඩම් |
| රාබු | පේර |
| කරවිල | ගස්ලබු |
| ලීක්ස් | දෙළුම් |

| කුරුල්ලන් | සිවුපා සතුන් |
|---|---|
| මයිනා | බල්ලා |
| දෙමලිච්චා | පූසා |
| පොල්කිච්චා | අලියා |
| ගේ කුරුල්ලා | වලහා |
| වඩු කුරුල්ලා | අශ්වයා |

| ධාන්‍ය වර්ග | ඖෂධ |
|---|---|
| මුංඇට | කෝමාරිකා |
| පරිප්පු | කොහොඹ |
| කුරක්කන් | පාවට්ටා |
| කඩල | කොත්තමල්ලි |
| වී | රණවරා |

| මල් වර්ග | ගස් වර්ග |
|---|---|
| රෝස | කොස් |
| වද | කොහොඹ |
| වතුසුද්ද | අඹ |
| සූරියකාන්ත | තේක්ක |
| ඇසළ | රඹුටන් |

## පෞද්ගලික ලිපි

- පෞද්ගලික ලිපියක ආකෘතිය

| |
|---|
| ස්ථානය<br>දිනය<br><br>ආශීර්වාදය<br><br>ආමන්ත්‍රණය<br><br>කරුණු ලිවීම . . . . . . . . . . .<br>. . . . . . . . . . . . . . . . . . . . . .<br>. . . . . . . . . . . . . . . . . . . . . .<br>. . . . . . . . . . . . . . . . . . . . . .<br>. . . . . . . . . . . . . . . . . . . . . .<br>. . . . . . . . . . . . . . . . . . . . . .<br><br>අවසානය |

✓ ලිපියේ දකුණු පසින් ලිපිය ලියන ස්ථානයත්, දිනයත් සඳහන් කරන්න.

✓ එහි දී ස්ථානය ලියූ තැන අගට කොමාව යොදන්න.

✓ පෞද්ගලික ලිපියක් ලිවීමේ දී ලිපිය යවන්නාට ආශිර්වාද කිරීමට සුදුසු ආශිර්වාද වදනක් ලියන්න. උදාහරණ - සැප වේවා!

✓ ආශීර්වාදය ලියා අවසානයේ දී හර්ෂාදි ලකුණ යොදන්න. ඥාතීන්ට ලිපියක් ලිවීමේ දී ආමන්ත්‍රණය සඳහා ආදරණීය/සදාදරණීය/දයාබර වැනි වදන් යොදන්න.

✓ මිතුරෙකුට හෝ වෙනත් හිතවතෙකුට හෝ ලිවීමේ දී මා හිතවත් යනුවෙන් ලියා මිතුරාගේ /මිතුරියගේ නම සඳහන් කරන්න.ආමන්ත්‍රණය ලියා අවසානයේ කොමාව යොදන්න.

✓ කරුණු ලිවීමේ අවස්ථාවේ දී ආමන්ත්‍රණයට යටින් ඇති රූළේ කුඩා ඉඩ ප්‍රමාණයක් හැර ලිවීම ආරම්භ කරන්න.

✓ එහි දී ඥාතියාගේ/ මිතුරාගේ/මිතුරියගේ/ සහෝදරයාගේ/සහෝදරියගේ සුවදුක් විමසීමත්, තමා ඇතුළු පවුලේ අය සුවෙන් සිටින බවත් ලියන්න.

✓ ලිවිය යුතු කරුණු ජේළි හයක්/අටක් වැනි ප්‍රමාණයකින් ලියන්න. කරුණු ලියා අවසානයේ දී ද සෙත් පැතීම සඳහා වාක්‍යයක් ලියන්න. සෙත් පැතීම තමාගේ ආගමට අනුව තෙරුවන් සරණ යි/ජේසු පිහිට යි/දෙවි රැකවරණ යි . . . ආදි ලෙසින් කළ හැකි ය.

✓ ලිපිය ලියා අවසන් කරන විට ලිපිය ලියූ තැනැත්තා කවරෙක් ද යන්නත් නමත් සඳහන් කරන්න. නමට ඉහළින් ඇති වචනයේ අගට කොමාව යොදන්න.

- දී ඇති ලිපිය කියවා බලා පහත සඳහන් එක් අවස්ථාවක් යටතේ පෞද්ගලික ලිපියක් ලියන්න.

1. ඔබ පාසල් නේවාසිකාගාරයක නැවතී සිට පාසල් යන දුවෙක්/පුතෙක් ඔබ යැයි සිතා තම මවට/පියාට/ආච්චි අම්මාට/සීයාට තමාගේ විස්තර දන්වා යවන ලිපියක්

2. ඔබගේ හොඳ ම මිතුරා/මිතුරිය අසනීප වී සිටින බව දැනගත් විට ඒ පිළිබඳ තොරතුරු විමසමින් යවන ලිපියක්

3. ඔබත් පවුලේ අයත් ඉදිරියේ දී යාමට බලාපොරොත්තු වන විනෝද ගමනකට ඔබේ යහළුවෙක්/යෙහෙළියක සහභාගි කර ගැනීමට කැමැත්ත විමසමින් යවන ලිපියක්

නිවසේ දී,
2018.08.08

සෙත් වේවා !

මා හිතවත් පසිඳු වෙත,

ඔබගේ සැපදුක් කෙසේ ද? මම සුවෙන් සිටිනවා. ඔබගේ අම්මා, තාත්තා සහ අක්කා ද සුවෙන් ඇතැයි සිතනවා.

අගෝස්තු නිවාඩු කාලය ලැබුණු පසු, මම ඔබගේ නිවසට පැමිණෙන්නම්. එවිට අපට සෙල්ලම් කිරීමට හැකි වේවි. ඔබේ ගමේ ඇවිදීමට ද මම ආශාවෙන් සිටිනවා. මා පැමිණෙන දිනය ඔබට පසු ව දන්වා එවන්නම්.

ඔබගේ පවුලේ සැම මතක් කළ බව පවසන්න.
ඔබ සැමට තෙරුවන් සරණ යි !

හිතවත් මිතුරා,
දෙනුවන්

---

නිවසේ දී,
2022.06.25

සෙත් වේවා !

මා හිතවත් තිනුක වෙත,

ඉස්කෝලේ නිවාඩු දෙන්න ළඟ නිසා මේ ලිපිය ලියන්නේ සතුටුදායක ආරංචියක් කියන්න. මේ අවුරුද්දෙ අපි ශ්‍රී පාදෙ වඳින්න එක්ක යනවා කියලා අපේ තාත්තා පොරොන්දුවක් වුණා මතක ද? ඉතින්, ඔයා ආවොත් අපි හැමෝට ම ශ්‍රී පාදෙ කරුණා කරන්න පුළුවනි. ඒ නිසා මේ නිවාඩුව ලැබුණු ගමන් ම අපි ගමනට පිටත් වෙමු. අපට තුන් සරණේ කිය කියා හිමේ නගින්න පුළුවනි. සීත ගඟුලෙ නාලා, ඉර සේවෙත් බලලා ශ්‍රී පාදෙ වන්දනා කරමු.


මේ දවස්වල මෙහෙ හරි ම සීතලයි. කඳු යාය ම මීදුමෙන් වැහිලා බලන්න ලස්සනයි. ඔයාලගෙ ගමනට අඳින ඇඳුම් ගේන්න කියලා අම්මට කියන්න. තාත්තාටත් කලින් ම නිවාඩු ගන්න වේවි නෙ. ඒ නිසා අපි කල් ඇතිව සූදානම් වෙලා මේ ගමන යමු.

ඔබගේ පවුලේ සැම මතක් කළ බව පවසන්න.
ඔබ සැමට තෙරුවන් සරණ යි !

හිතවත් මිතුරා,
තිසල

# කාටූන්

- පහත දැක්වෙන කාටූන්වලින් කියවෙන පණිවිඩය පිළිබඳ ව ඔබේ අදහස් ලියන්න.



ආහාර ගැනීමට සූදානම් වන ළමයා රූපවාහිනිය ඉදිරියට ගොස් එය නරඹමින් ආහාර ගැනීමට සිතා, ආහාර පිඟාන පසෙකින් තබා රූපවාහිනිය නරඹයි.

ඒ අතර තුර නිවසේ සුරතලයට ඇති කරන බල්ලා පැමිණ අහාර පිඟාන කා දමයි. රූපවාහිනී වැඩසටහනට සිත යොමු වීම නිසා ළමයාට ආහාර අහිමි වෙයි.

අපි එදිනෙදා කරන කටයුතු වලදී සිහි කල්පනාවෙන් වැඩ කළ යුතු ය. නැතහොත් අපට වටිනා දේවල් මග හරී යයි, රූපවාහිනිය නරඹමින් ආහාර ගැනීමට වඩා කෑම මේසයේ සිට ආහාර ගැනීම වඩාත් සුදුසු ක්‍රමයයි. එවැනි පණිවිඩ රූපයේ දැක්වෙන කාටූන්වලින් කියැවේ.

- පහත දී ඇති අවස්ථා වලින් ඔබ කැමති අවස්ථාවක් තෝරා ගෙන කාටූන් චිත්‍රයක් බැගින් අඳින්න. ප්‍රදර්ශනය කරන්න.

1. අවස්ථාව
   - ✓ ගඟක ඉවුර අසල තාරා පැටවු දෙන්නෙකු සිටිනවා.
   - ✓ ඒ අසලට හාවෙකු ඇවිත් ගඟෙන් එගොඩ කරවිය හැකි දැයි අසනවා.
   - ✓ තාරා පැටවුන් දෙන්නාගේ පිට උඩ නැග හාවා ගඟෙන් එතෙර වෙනවා.

2. අවස්ථාව
   - ✓ ගංගාවක පතුලේ ගෙඹි පැටවුන් දෙදෙනෙකු කණු දෙකක ලණුවක් බඳිනවා. (ලණුව බැඳ ඇත්තේ කොකෙකුගේ කකුල් දෙකක යි.)
   - ✓ ඒ බව නොදත් ගෙඹි පැටවු දෙන්නා බැඳපු ලණුවේ නැග සිටිනවා.
   - ✓ කොකා ගෙඹි පැටවුන් දෙන්නා රැගෙන ඉහළ අහසට ඉගිලී යනවා. ගෙඹි පැටවුන් බයෙන් සිටිනවා.

<u>පුනරීක්ෂණ</u>

**(1) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ඈත අතීතයේ කාලෙක යොසාකු කියලා තරුණ ගොවියෙක් හිටියා. එක දවසක් කුඹුරේ වැඩ කරමින් සිටිය දී සර්පයෙක් මකුළුවෙකු අල්ලා ගන්න හදන හැටි යොසාකු දැක්කා. යොසාකුට මකුළුවා ගැන හරියට දුක හිතුණා. ඔහු උදැල්ල අරන් එතැනට දුවලා සර්පයා බය කර පැන්නුවා.

1. තරුණ ගොවියාගේ නම කුමක්ද? ....යොසාකු....
2. මකුළුවෙකු අල්ලා ගැනීමට උත්සාහ කළේ කවුද? ....සර්පයෙක්....
3. විරුද්ධාර්ථ පදය ලියන්න.

   නොදැක්කා දැක්කා
4. 'උදැල්ල' ඉරි ඇඳි අකුරේ ඇති පිල්ලමේ නම කුමක්ද? කෙටි ඇදපිල්ල
5. 'ඔහු සර්පයා බය කර පැන්නුවා' මෙම වාක්‍ය ලිඛිත බසට හරවා ලියන්න.

   ....ඔහු සර්පයා බයකර පැන්නුවේ ය....

**(2) වර්තමාන කාල ක්‍රියා පදය යොදා හිස්තැන් පුරවන්න.**

1. මම පාසලට ....යමි....
2. අපි නියර දිගේ ....යමු....
3. නංගී පාඩම් ....කරයි....
4. ගඟ මුහුදට ගලා ....බසියි....
5. කුරුල්ලා අහසේ පියාසර ....කරයි....

**(3) පහත කවි සම්පූර්ණ කරන්න.**

1. වනන්තරේ ඈත එපිට

   නෙලුම් පිපුණ විලක් ඇතී....

   නිල් වතුරෙන් පිරුණු කලට

   වන සිවුපාවෝ ඇදෙතී....

2. ගැඹුරු විලේ මඩ වතුරේ

   පා එරිලා හඬ නගතී....

   ගොඩ එන්නට බැරිව දුකින්

   සිවුපාවෝ කල් ගෙවතී....

**(4) එක් එක් වචනවල ඇති පිල්ලම් සියල්ලම නම් කරන්න.**

1. ඖෂධිය - ....ගයනුකිත්ත....
2. වාක්‍ය - ....ඇලපිල්ල....
3. වෘත්තය - ....ගැටඇලපිල්ල....
4. හිරු - ....කෙටි ඉස්පිල්ල, කෙටි ඇද පාපිල්ල
5. මැරෑහ - ....කෙටි ඇදපිල්ල, දික් ඇද පාපිල්ල

**(5) ගැළපෙන අකුරු කොටුව තුළින් තෝරා ලියන්න.**

| ධ , ළු , ඵ , හ , ප , ශ , න , ණ , ක , රැ , රු , ස |
|---|

1. විභාග ප්‍රති...ඵ...ල
2. හිරු ...රැ...ස්
3. පු...රු...ද්ද
4. පරීක්ෂ...ණ....



(6) නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. අම්මා එනතුරු (මම / අපි) බලා සිටියෙමි.
2. අපි නෙළුම් මල් රැගෙන පන්සල් (ගියෝය / ගියෙමු)
3. (ළමුන් / ළමයි) සෙල්ලම් කිරීමට පිටියට ගියහ.
4. කිකිළිය පසුපස පැටව් දුවගෙන (යයි / යති)
5. මල්ලීට අලුත් ඇඳුමක් මැසීමට අම්මා (සිතුවාය / සිතුවේය)

(7) නිවැරදි ස්ත්‍රීලිංග පදය ලියන්න.

1. මුවා - ...මුව දෙන
2. මුවෝ - මුව දෙන්නු
3. ඇත්තු - ඇතින්නියෝ
4. හිවලා - හිවල් ධේනුව
5. වෘකයා - වෘක ධේනුව

(8) කොටුව තුළ ඇති වචන පමණක් උපයෝගී කරගෙන නිවැරදි වාක්‍ය 5ක් ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| දෙමාපියෝ | ගස් | සෙනසුරාදා | බැලීමට | චිත්‍ර |
| යට | ගියාය | සිසුහු | ගියෙමු | නරඹා |
| ගුරුතුමිය | ගොස් | අද්දර | ළමයින් | වැව |
| නැරඹූහ | අපි | සීගිරිය | ඉඳගත්හ | සෙවණේ |

1. අපි සීගිරිය නැරඹීමට ගියෙමු.
2. සිසුහු වැව අද්දර ඉඳගත්හ.
3. ගුරුතුමිය චිත්‍ර බැලීමට ගියාය.
4. අපි සීගිරිය නරඹා වැව බැලීමට ගියෙමු.
5. දෙමාපියෝ ගස් සෙවණේ ඉඳගත්හ.

(9) පහත අනුක්ත පද උක්ත පද කර ලියන්න.

1. පැටවුන් - පැටවු
2. ළමයින් - ළමයි
3. මොනරුන් - මොනරු
4. අප - අපි

(10) දී ඇති වචන ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

අසල්වැසියෝ, අම්මා, මල්, පලතුරු, පොල් මුල, වත්ත, බිරිඳ, ලොකු අම්මා, සිඟිත්තිය, කොහු, පූසි පැටවා, සීයා, සායම්, පැදුරු, අකුරු, ලේඛිකාව, චිත්‍රය, නැන්දා, සම්මාන, තාත්තා

| ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|
| අසල්වැසියෝ | සම්මාන |
| අම්මා | මල් |
| බිරිඳ | පලතුරු |
| ලොකු අම්මා | පොල්මුල |
| සිඟිත්තිය | වත්ත |
| පූසි පැටවා | කොහු |
| සීයා | සායම් |
| ලේඛිකාව | පැදුරු |
| නැන්දා | අකුරු |
| තාත්තා | චිත්‍රය |
| — | සම්මාන |

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප **3in1 Youtube** නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

# හසිත හෙට්ටිආරච්චි
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



**3 in 1 youtube** නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ